සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## වර්ෂ අවසාන ඇගයීම - 2013

29836

## 7 - ශ්‍රේණිය

## ජීවන නිපුණතා හා පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය:- ............................................................................. කාලය: පැය 2යි.

උපදෙස් - පළමු කොටසේ සියලුම ප්‍රශ්නවලට මෙම පත්‍රයේම පිළිතුරු සපයන්න.

දෙවැනි කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු සපයා පළමු කොටසට අමුණා බාර දෙන්න.

### I කොටස

* අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

1. ඔබ කියන කරන සෑම කටයුත්තක්ම............................ සහගතව කිරීමෙන් ඔබටත් අන් අයටත් පහසුවක් වනු ඇත. (කාර්යයන්, සැලසුම්, අපිළිවෙළට)

2. මව, පියා දරුවන් පමණක් ජීවත් වන පවුල ........................................... ලෙස හැඳින්වේ. (න්‍යෂ්ටික පවුල, විස්තෘත පවුල ,නාගරික පවුල )

3. ශ්‍රී ලංකාවේ බෞද්ධ සංස්කෘතික ලක්ෂණ වැඩි වශයෙන් ඉස්මතු වන ආගමික උත්සවයකි. ............................ (දුරුතු පෙරහැර, කතරගම පෙරහැර, දළදා පෙරහැර)

4. පවුලේ හා සමාජයේ ............................ සඳහා ඔබෙන් ඉටුවිය යුතු යුතුකම් රාශියක් ඇත. (ජන ජීවිතය, යහ පැවැත්ම, අපකීර්තිය)

5. යහපත් අන්තර් පුද්ගල සබඳතා ගොඩනැඟීමේ දී යහපත් ............................ භාවිතය ඉතා වැදගත් වේ. (චර්යාවන්, වචන, හැඟීම්)

* අංක 6 - 10 දක්වා ප්‍රකාශන නිවැරදි නම් '✓' ලකුණ ද, වැරදි නම් '✗' ලකුණ ද, ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.

6. මිතුරු වෙසින් සිටිමින් අන් අයට හිරිහැර නොකළ යුතුය. (........)

7. විදේශ ගමන් බලපත්‍රය පුද්ගලයෙකු පිළිබඳ නිවැරදි දත්ත හා තොරතුරු ඇතුළත් ලේඛනයකි.(........)

8. පවුල් තුළ අනුගමනය කරන සම්ප්‍රදායයන් කෙරෙහි ප්‍රාදේශීය විවිධත්වය හා සංස්කෘතික විවිධත්වය බල නොපායි. (........)

9. ශ්‍රී ලංකාවේ ජාතික ගීයේ නිර්මාතෘවරයා ඩබ්.ඩී. අමරදේවයන්ය. (........)

10. සතුන් සහයෝගයෙන් කටයුතු කරන අවස්ථා නිරීක්ෂණය කිරීමෙන් අපට ද ආදර්ශයක් ලබාගත හැක. (........)

* අංක 11 - 15 දක්වා ප්‍රශ්නවලට සුදුසු වචන යොදා හිස්තැන් පුරවන්න.

11. ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත්වූයේ ..................................................වර්ෂයේදීය.

12. හිතකර බලවේග පුද්ගලයා සුමඟට යොමු කරන අතර.......................................................................

බලවේග පුද්ගලයා නොමඟට යොමු කරයි.

13. විවේකය ලැබෙන ඕනෑම අවස්ථාවක් . ..................................................ලෙස ගත කිරීම

වැදගත් වේ.

14. තමාගේත් අන් අයගේත් යහපතට හේතු වන උසස් ගුණාංග .............................. යන නමින්

හැඳින්වේ.

15. ශ්‍රී ලංකාවේ ජාතික මට්ටමින් දත්ත හා තොරතුරු රැස් කරන්නේ ...............................................

දෙපාර්තමේන්තුව මඟිනි.

* අංක 16 - 20 දක්වා ප්‍රශ්නවලට 'A' කොටසේ ඇති ප්‍රකාශයන්ට ගැළපෙන ප්‍රකාශ 'B' කොටසින් තෝරා ඊට අදාළ අක්ෂරය වරහන තුළ ලියන්න.

| 'A' | | 'B' |
|---|---|---|
| 16. බුදු දහමේ දියුණුවට කටයුතු කිරීම | (.....) | a. දමිළ ජනතාව |
| 17. ලාදුරු රෝගීනට ප්‍රතිකාර කිරීම | (.....) | b. සෙනෙරත් පරණවිතාන මහතා |
| 18. ජාතික ධජයේ තැඹිලි වර්ණය | (.....) | c. අනගාරික ධර්මපාල තුමා |
| 19. ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැතිතුමා | (.....) | d. තෙරේසා මව් තුමිය |
| 20. ශ්‍රී ලංකාවේ පෞරාණික ඉතිහාසය මතු කරලීම | (.....) | e. ඩී. එස්. සේනානායක මහතා |

(ලකුණු 2x20= ල. 40)

## II කොටස

* පළමු වැනි ප්‍රශ්නය අනිවාර්ය වේ.

* තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(1) තෙවැනි වාර අවසාන ඇගයීම ලෙස තම ප්‍රදේශයේ ස්වේච්ඡා සංවිධාන පිළිබඳ තොරතුරු අධ්‍යයනය කර වාර්තාවක් සකස් කර බාර දෙන ලෙස ඔබට ගුරුතුමා උපදෙස් දෙන්නට ඇත. එම ක්‍රියාකාරකම ඇසුරින් පහත ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

- (i) ඔබ විසින් තොරතුරු අධ්‍යයනය කළ ස්වේච්ඡා සංවිධාන දෙක නම් කරන්න. (ල. 2)
- (ii) එම එක් සංවිධානයක අරමුණු දෙකක් නම් කරන්න. (ල. 2)
- (iii) සංවිධානයන් පිළිබඳ තොරතුරු සෙවීමට ඔබ මුණගැසුණු සංවිධානයේ නිලධාරීන් දෙදෙනෙක් ලියන්න. (ල. 2)
- (iv) තොරතුරු සෙවූ එක් ස්වේච්ඡා සංවිධානයකින් සමාජයේ යහපතට කටයුතු කරන ආකාර දෙකක් සඳහන් කරන්න. (ල. 2)
- (v) සංවිධාන දෙක පිළිබඳ ව තොරතුරු සොයා ඉදිරිපත් කළ අංශ දෙකක් ලියන්න. (ල.4)
- (vi) ඔබ තොරතුරු සෙවූ ස්වේච්ඡා සංවිධානයක් මඟින් තව දුරටත් සමාජයේ දියුණුව සඳහා කටයුතු කළ හැකි ආකාර දෙකක් යෝජනා කරන්න. (ල.4)

(2)
- (i) "ලොව කිසිම තැනක එක සමාන දැතක් පමණක් නොව සමාන වැලි කැට දෙකක් හෝ නැති බව" පැවසූ ලේඛකයා නම් කරන්න. (ල. 2)
- (ii) සමාජයේ යහපතට හේතු වන පුද්ගලයන් දෙදෙනෙක් ද ආයතන දෙකක් ද සඳහන් කරන්න. (ල.4)
- (iii) මනා සැලැස්මකට අනුව කටයුතු කිරීමෙන් ඔබටත් අන් අයටත් ඇති වන යහපත් ප්‍රතිඵල දෙකක් ලියා ඒවා කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 5)

(3)
- (i) පරිසර සංවේදීතාවයට අදාළ සාරධර්ම දෙකක් නම් කරන්න. (ල. 2)
- (ii) ඔබගේ ජීවිතය සාර්ථක කරගැනීමට අදාළ සාරධර්ම හතරක් නම් කරන්න. (ල. 4)
- (iii) වනෝද්‍යානයක් නැරඹීමට ගිය ඔබ ඒ තුළින් ලැබූ අත්දැකීම් ඇසුරින් පාසලේ ප්‍රදර්ශනය කිරීමට උචිත ආදර්ශ වැකි පහක් නිර්මාණය කරන්න. (ල.5)

(4) "විවිධ පුද්ගලයන් ඇසුරින් ගොඩනඟා ගන්නා යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා පුද්ගල සංවර්ධනයට හේතු වේ"

- (i) පුද්ගලයන් සමඟ ඇසුරු කිරීමට අප තුළ වර්ධනය කරගත යුතු නිපුණතා දෙකක් ලියන්න. (ල.2)
- (ii) ගැටුම් ඇති වීමට බලපාන හේතු හතරක් ලියන්න. (ල.4)
- (iii) යහපත් අන්තර් පුද්ගල සම්බන්ධතා නොපැවැත්වීම නිසා ඔබ පාසලේ දී මුහුණ දුන් ගැටුම්කාරී අවස්ථාවක් ලියා, එම අවස්ථාවේ දී ඔබට හිතට දැනුන හැඟීම් පිළිබඳ ව විස්තර කරන්න. (ල.5)

(5) (i) න්‍යෂ්ටික පවුලක දැකිය හැකි ලක්ෂණ දෙකක් නම් කරන්න. (ල.2)

(ii) පවුලේ සාමාජිකයෙකු වශයෙන් ඔබෙන් පවුලට ඉටුවිය යුතු යුතුකම් හතරක් සඳහන් කරන්න. (ල.4)

(iii) ඔබ නිවස අවට අසල්වැසියන්ගෙන් ඔබේ ජීවිතයට උදවු උපකාර ලැබුණු අවස්ථා පහක් ලියන්න. (ල.5)

(6) එකිනෙකාගේ යුතුකම් වගකීම් ඉටු කිරීම මඟින් පුද්ගලයන් අතර සුහදතාවය වර්ධනය වේ.

(i) සමාජයේ යහපැවැත්ම සඳහා පුරවැසියන් විසින් ඉටු කළ යුතු සදාචාරාත්මක යුතුකම් දෙකක් සඳහන් කරන්න. (ල.2)

(ii) (ජීවත් වීමේ අයිතිය, ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිය, ආණ්ඩුව විවේචනය කිරීමේ අයිතිය, කැමති ආගමක් ඇදහීමේ අයිතිය )

ඉහත අයිතිවාසිකම්

a. සිවිල් අයිතිවාසිකම්

b. දේශපාලන අයිතිවාසිකම් ලෙස බෙදා දක්වන්න. (ල.4)

(iii) පුද්ගලයන් තම තමන්ට හිමි යුතුකම් ඉටු කිරීම මඟින් සමාජයේ යහපැවැත්ම සිදු වන ආකාරය කරුණු දෙකක් ඇසුරින් පහදන්න. (ල.5)

(7) රටක ජාතික ගීය හා ජාතික කොඩිය මඟින් ජාතික අනන්‍යතාවය හා ජාතිකාභිමානය පිළිබිඹු වේ.

(i) ශ්‍රී ලංකාවේ ජාතික ගීය තුළින් ජාතික එකමුතු බව පිළිබඳ කියැවෙන පද දෙකක් ලියන්න. (ල.2)

(ii) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය හා ජාතික වෘක්ෂය නම් කරන්න. (ල.4)

(iii) ජාතික කොඩිය එහි ගෞරවයට හානි කර ලෙස භාවිත කරන අවස්ථා ඔබ දැක ඇත. එවන් අවස්ථා පහක් සඳහන් කරන්න. (ල.5)